# ගල්අතර පුරාවිද්‍යා ක්ෂත්‍රය පිළිබඳ මූලික අධ්‍යනයක්

ඩබ්.එම් ශිරන්ත රුවන් වාසල

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
arushantha33@gmail.com

---

ගල්අතර පුරාවිද්‍යා ක්ෂත්‍රය කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්මඩල ග්‍රාමසේවා වසමේ පිහිටා තිබේ. පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇති මෙම ස්ථානය පිළිබඳව පර්යේෂණ සිදුව ඇත්තේ අවම වශයෙනි. වර්තමානය වන විට එහි සුසාන දක ගත නොහැකි වුවත් තදානුබද්ධ ආංශුක කලාපය ආශ්‍රයෙන් තත් අවධිය පිළිබඳව වැදගත් පුරාවිද්‍යා සාධක හා මානවවංශ දත්ත හඳුනාගැනීමේ අවකාශ ඇත.

මෙහි දී ගල්අතර සුසාන ක්ෂේත්‍රයට ආසන්නයේම පිහිටි අස්මඩල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ද මූලික ගවේෂණ කටයුතු සිදු කළ අතර එහි දී යථෝක්ත සුසාන භූමියේ මිහිදන් කරන ලද මිනිසුන් තත් ලෙන් සංකීර්ණයේ ජීවත් වූ බව සිතිය හැකි සාධක හඳුනාගැනීමට හැකි විය. ඒ අතර පූර්ව බ්‍රාහ්මී අභිලේඛන, බ්‍රාහ්මී නොවන සංකේත හා සිරුම් චිත්‍ර විශේෂ වේ. තව ද ගල්අතර ආංශුක කලාපයෙන් පෙන්නුම් කරන දණගිරිගල, වාකිරිගල වැනි පුරාවිද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව ද අපගේ අවධානය යොමු විය. එකී දත්ත ඔස්සේ තත් ක්ෂේත්‍රයේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සන්දර්භය අවධාරණය කිරීම හා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීමට මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිත ය.

ප්‍රමුඛ පද : ගල් අතර, පූර්ව ඓතිහාසික යුගය, සුසාන, අස්මඩල